# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 161/10 — 1975 අප්‍රේල් 30 වැනි බදාදා — 1975.04.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### අංක 161 දරණ අත්කර ගැනීමේ ආඥව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ ආඥව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති පිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත දේපල, (ලියාපදිංචි කිරීමේ අංක කො/2459 දරණ) සීමාසහිත කොළඹ උතුර සමුපකාර සමිතියේ යම් ව්‍යාපාරයක කාර්යයන් සඳහා එකී සමිතිය විසින් ප්‍රයෝජනයට ගත හැකිවනු පිණිස 1975. 05. 12 වැනි දින සිට මෙම ආඥව මගින් අත්කර ගනිමි.

1975. 04. 22 වැනි දින,
කොළඹ දී ය.

පී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

#### උපලේඛනය

පහත සඳහන් පරිදි මායිම් වූ ද, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අළුත්කඩේ ග්‍රාම සේවක කොට්ඨාශයේ ග්‍රෑන්පාස් පාරේ පිහිටියා වූ ද, වරිපනම් අංක 336 දරන ඉඩම හා ගොඩනැගිල්ල—

උතුරට : වරිපනම් අංක 342 ග්‍රෑන්පාස් පාර ;
දකුණට : වරිපනම් අංක 332 ග්‍රෑන්පාස් පාර ;
බස්නාහිරට : ග්‍රෑන්පාස් පාර ;
නැගෙනහිරට : වරිපනම් අංක 342 ග්‍රෑන්පාස් පාර.

5-219

---

### අත්කරගත් බුක්තිය අත්හැරීමේ නියෝග අංක 8

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ නියෝගය

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10(4) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති පිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි සඳහන් වූ අංක 121/3 හා 1974.07.22 දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත (අංක 119 දරණ) නියෝගයෙන් බුක්තිය අත්කර ගත්තා වූ ද, දේපලවල ඒ අත්කරගත් බුක්තිය 1975.04.24 දින සිට මෙයින් අත්හරිමි.

1975.04.24 වැනි දින,
කොළඹ දී ය.

පී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ, කොල්ලුපිටිය ග්‍රාම සේවක කොට්ඨාශයේ කොළඹ 3, ඩුප්ලිකේෂන් පාරේ පිහිටි වරිපනම් අංක 33 දරන ගොඩනැගිල්ල මෙහි පහත සඳහන් මායිම් අනුව අත්කර ගැනීම—

උතුරට : ඩුප්ලිකේෂන් පාරේ වරිපනම් අංක 35 ;
නැගෙනහිරට : 24 වෙනි පටුමග ;
දකුණට : ඩුප්ලිකේෂන් පාරේ වරිපනම් අංක 31 ;
බස්නාහිරට : ඩුප්ලිකේෂන් පාර.

5-220


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A—ඒ 13483—4,325 (75/03)